පෞද්ගලිකත්වය (Privacy) හා කුකීස් (Cookies) පිළිබඳ අපගේ ප්‍රතිපත්තිය යාවත්කාලීන කර ඇත.

පෞද්ගලිකත්වය (Privacy) හා කුකීස් (Cookies) පිළිබඳ අපගේ ප්‍රතිපත්තියට එක්කර ඇති වැදගත් වෙනස්කම් ඔබට සහ ඔබගේ දත්තවලට අදාළවන්නේ කෙසේදැයි ඔබ දැනුවත්වීම අවශ්‍යය.

හරි

වෙනස් කර ඇත්තේ මොනවාදැයි දැනගන්න



# නව මකුළුවන් විශේෂ 104ක් ලොවට හඳුන්වා දුන් ශ්‍රී ලාංකික මහාචාර්යවරයා

ෂර්ලි උපුල් කුමාර
BBC සිංහල

24 නොවැම්බර් 2020

මහාචාර්ය සුරේෂ් පී බෙන්ජමින් ශ්‍රී ලංකාවෙන් සොයාගත් මකුළු විශේෂ 82කි. තවත් විශේෂ 22ක් වෙනත් රටවල් හතකින් හඳුන්වා දී තිබේ

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ (NIFS) පරිණාමය, පරිසර විද්‍යාව සහ පරිසර ජීවවිද්‍යා පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධානියා ලෙස සේවය කරන මහාචාර්ය සුරේෂ් පී බෙන්ජමින් මේ වන විට නව මකුළුවන් විශේෂ 104ක් ලොවට හඳුන්වාදී තිබේ. තවත් නව මකුළු විශේෂ 50ක් පමණ හඳුන්වාදීමට අදාළ කටයුතු අවසන් අදියරේ පවතින බව ඔහු බීබීසී සිංහල සේවයට කියා සිටියේය.

මේ වනවිට ඔහු හඳුන්වා දී ඇති මකුළුවන් විශේෂ 104 අතරින්, විශේෂ 82ක් සොයාගෙන තිබෙන්නේ ශ්‍රී ලංකාවෙනි. වෙනත් රටවලින් හඳුන්වාදී ඇති මකුළුවන් විශේෂ ගණන 22කි. ඉන්දුනීසියාව (07), බ්‍රසීලය (04), මැලේසියාව (03), ඉන්දියාව (04), මැඩගස්කරය (01), ටැන්සානියාව (02) යන රටවලින් සහ ඩොමිනිකන් රාජ්‍යයෙන් (01) එම නව මකුළුවන් විශේෂ හඳුන්වා දී තිබේ.

## ආදර දැල දැමූ 'දූෂානි' නමින් මකුළුවෙක්

මහාචාර්ය සුරේෂ් පි බෙන්ජමින් සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කර තිබෙන්නේ මකුළුවන් දැල් සාදන ආකාරය පිළිබඳවයි. අවසානයේ ඔහු පැටළුණු 'ආදර දැල' සිහිවීම සඳහා ද නව මකුළු විශේෂයක් නම් කර තිබේ.

"මගේ ගුරුවරයා වන මහාචාර්ය කොන්රාඩ් තාලර් නමින් එක මකුළුවෙක් නම් කළා. මකුළුවන්ගේ පාට, කැපීපෙන ලක්ෂණ සහ හොයාගත්ත තැන් වලින් වගේම මයිකල් ඔන්ඩච්චි වගේ නවකතාකරුවන්ගේ නම් වලිනුත් මකුළුවෝ නම් කළා. සිංහරාජයෙන් මට හමුවුණු ලස්සන මකුළුවෙක් ඉන්නවා. ඒ මකුළුවා නම් කළේ මගේ බිරිඳ, දූෂානි බෙන්ජමින්ගේ නමින්. දැන් අලුතෙන් නම් හොයන එකත් පොඩි ගැටලුවක් වෙලා," යනුවෙන් මහාචාර්යවරයා සිනා සුනේය.

BBC

SURESH BENJAMIN

සිංහරාජයෙන් සොයාගත් එක් මකුළු විශේෂයක් නම් කර තිබෙන්නේ සිය බිරිඳගේ නමිනි

කොළඹ දී උපත ලැබූ මහාචාර්ය සුරේෂ් පී බෙන්ජමින් උසස් පෙළ දක්වා කොළඹ ඉසිපතන විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා තිබේ. ඉන් අනතුරුව ඔහු ඔස්ට්‍රියාවේ ඉන්ස්බ්රුක් විශ්වවිද්‍යාලයෙන් (University of Innsbruck) විද්‍යාපති උපාධියත්, ස්විට්සර්ලන්තයේ බාසල් විශ්ව විද්‍යාලයෙන් (University of Basel) ආචාර්ය උපාධියත් හිමිකරගෙන තිබේ.

පසුව ඇමරිකාවේ ද වැඩිදුර අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවට පැමිණ පර්යේෂණ මහාචාර්යවරයෙකු ලෙස හන්තානේ පිහිටි (NIFS) සේවයට එක් විය.

දෙහිවල, අත්තිඩිය ප්‍රදේශයෙන් සොයාගත් නව මකුළුවෙකු 2010 වසරේදී ලොවට හඳුන්වා දීම මහාචාර්ය බෙන්ජමින්ගේ පළමු සොයාගැනීම වේ.

## 'දැනුමෙන් රටට වැඩක් කරන්න ආශාවක්'

අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා වසර 20ක් පමණ වෙනත් රටවල ජීවත් වීමෙන් අනතුරුව ඔහු යළි ශ්‍රී ලංකාවට පැමිණියේය.




ශ්‍රී ලාංකික මහාචාර්යවරයෙක් නව මකුළුවන් විශේෂ 104ක් ලොවට හඳුන්වා දෙයි

"මම ලෝකේ රටවල ගිහින් තියෙනවා. ඇතිවෙන්න හිටියා කියලා මට හිතෙනවා. ලංකාවේ සත්තු අධ්‍යයනය කරන්න, අපේ දැනුමෙන් රටට වැඩක් කරන්න මට ආශාවක් තිබුණා. ඒ නිසයි මම ලංකාවට ආවේ," යනුවෙන් මහාචාර්ය බෙන්ජමින් පැවසුවේය.

කෙසේ නමුත් මෙම පර්යේෂණ වලින් මිනිසුන්ට ක්ෂණික ප්‍රතිඵල අත් විඳිය නොහැකි නිසා, ඒවායේ වැදගත්කම ඇතැමුන්ට පහදා දීම අසීරු බව ද ඔහුගේ අදහස වී ඇත.

## මකුළුවන් ගැන අධ්‍යයනය කරන පිරිස අඩුයි

ශ්‍රී ලංකාවේ කුරුල්ලන්, උභය ජීවීන්, උරගයන් සහ සමනලුන් වැනි සත්ව කාණ්ඩ පිළිබඳව අධ්‍යයනයට සැළකියයුතු පිරිසක් එක් වී සිටිති. එහෙත් මකුළුවන් සහ කෘමීන් පිළිබඳව අධ්‍යයනය සඳහා යොමුව සිටින්නේ ඉතා සුළු පිරිසක් පමණි.

මේ වන විට ශ්‍රී ලංකාවෙන් හඳුනාගෙන ඇති මකුළුවන් විශේෂ සංඛ්‍යාව 596කි. ඉන් 90%ක් පමණ ශ්‍රී ලංකාවට ආවේණික වේ.

මහාචාර්ය සුරේෂ් පී බෙන්ජමින් පවසන ආකාරයට අප දැනට දන්නා විශේෂ මෙන් තවත් තුන් ගුණයක් පමණ ඉදිරියේදී සොයා ගැනීමට තිබේ.

"මගේ පර්යේෂණ කණ්ඩායමේ හත් දෙනෙක් විතර ඉන්නවා. ඊට අමතරව විනෝදයට අධ්‍යයනය කරන අය කිහිපදෙනෙක් ඉන්නවා. ලංකාවේ මකුළුවන් සහ කෘමීන්ගේ අලුත් විශේෂ කිහිපයක් හඳුන්වා දීපු පර්යේෂණ පත්‍රිකා හැරෙන්නට වෙනම පොත්පත් අඩුයි. ඒ වගේම මකුළුවන් සංඛ්‍යාවෙන් වැඩි නිසා බොහෝ දෙනෙක් මකුළුවන් අධ්‍යයනයට පෙළඹෙන බවක් පේන්න නෑ," යනුවෙන් මහාචාර්යවරයා පවසයි.

## මකුළුවන්ට ඇති තර්ජන

ශ්‍රී ලංකාවේ මකුළුවන්ට ඇති ප්‍රබලම තර්ජනය වන්නේ උන් ජීවත්වෙන පරිසරය විනාශවීමය. මානව ක්‍රියාකාරකම් සහ ස්වභාවික හේතූන් නිසා ආරක්ෂිත පරිසර පද්ධතිවල ඇති පවා වාසස්ථාන විනාශ වීමේ අවදානමක් මතුව තිබේ.

"මීට අවුරුදු 100කට විතර කලින් ප්‍රංශයේ මකුළුවෝ හදාරපු කෙනෙක් හඳුන්වලා දුන්න මකුළුවෙක්ව මම අවුරුදු හතරක් විතර ලංකාවේ හෙව්වා. දවසක් මම නකල්ස් කැලේ මකුළුවෝ හොයනකොට දියපාරක් ළඟ ඒ මකුළුවෝ ටිකක් දැක්කා. එතන හිටියේ පොඩි පැටවු. මම තුන් දෙනෙක්ව විද්‍යාගාරයට අල්ලාගෙන ආවා. අපිට පරීක්ෂණ වලට ඕනා හොඳින් වැඩුණු සත්තු. පසුව මම සති දෙකකින් විතර ලොකු මකුළුවෝ එකතු කරන්න යනකොට එතන නාය ගිහින්," යනුවෙන් ප්‍රකාශ කළේය.

එම දුර්ලභ මකුළුවන් විශේෂය යළි කිසිදා ඔහුට හමුවී නැත.

කෙසේ වෙතත් විද්‍යාගාරයේදී ඇතිදැඩි කළ මකුළුවන් යොදා ගෙන ඡායාරූප සහ සම්පූර්ණ විස්තර සහිතව එම මකුළු විශේෂය මහාචාර්ය බෙන්ජමින් විද්‍යාත්මක පර්යේෂණ පත්‍රිකාවක් තුළින් නැවත හඳුන්වා දී තිබුණි.

මෙලෙස අතීතයේ ප්‍රමාණවත් තොරතුරු නොමැතිව හඳුන්වා දී ඇති මකුළුවන් විශේෂ කිහිපයක් මහාචාර්ය බෙන්ජමින් නැවත විස්තරාත්මකව විද්‍යා ලොවට හඳුන්වාදී තිබේ.

මකුළුවන් පිළිබඳ විශේෂඥයෙකු වූ, මේ වනවිට ඇමරිකාවේ නිවුයෝක් හි ජීවත් වන ප්‍රියන්ත විජේසිංහ සිය පර්යේෂණ සඳහා සහය දැක්වූ බව ඔහු කෘතවේදීව සිහිපත් කළේය.

"අපි පරීක්ෂණ කරන මකුළුවො එකතුව තියෙන්නේ ජාතික මූලික අධ්‍යයන ආයතනයේ රසායනාගාරයේ. පරීක්ෂණ අවසන් වුණාම ඒ සත්තු ජාතික කෞතුකාගාරයට භාර දෙනවා. මොකද අපි හැමදාම ඉන්නේ නැනේ. කෞතුකාගාරය හැමදාම තියෙනවා," යනුවෙන් මහාචාර්ය බෙන්ජමින් වැඩිදුරටත් පැවසුවේය.

කියවන්න:

- ශ්‍රී ලංකාව 'පුංචි ඇමර්සන් වනයක්' - විද්‍යා ලොවේ වාර්තා අලුත් කළ ශ්‍රී ලාංකික විද්‍යාඥවරියක් පවසයි
- සත්ත්ව විශේෂ 26ක් ලොවට හඳුන්වා දුන් ශ්‍රී ලංකාවේ 'ඩාවින් පවුල'
- ශ්‍රී ලාංකික විද්‍යාඥයෙකුගෙන් පිළිස්සුම් තුවාල සුව කිරීමට අලුත් ක්‍රමයක්

## මේ පුවතට සම්බන්ධ තවත් විස්තර

**ලෝක උරුම සිංහරාජ වනයේ "ජෛව කොල්ලය සැලසුම් සහගත අපරාධයක්"**

2019 පෙබරවාරි 6

**ශ්‍රී ලාංකික විද්‍යාඥවරියකට ලෝක සම්මානයක්: "අත්‍යවශ්‍යම නම් පමණක් පර්යේෂණවලට සතුන් යොදා ගන්න"**

2020 නොවැම්බර් 13

**හයිඩ්‍රජන් ලෝහය:' විප්ලවීය සොයාගැනීමක්' කළ ශ්‍රී ලාංකික විද්‍යාඥයා**

2017 පෙබරවාරි 26

**"හොඳම තෑග්ග ජනතාවගේ සතුට" - හොඳම තරුණ විද්‍යාඥයා වූ ශ්‍රී ලාංකිකයා**

2017 සැප්තැම්බර් 1

## ප්‍රධාන පුවත

**ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හරහා ගැමි කාන්තාවන් සූරා කෑමකට ලක්වන බවට චෝදනා**
පැය 4 කට පෙර

**'රජ දැක්මට අවසරද?' දෙසැම්බර් අහසේ අසිරිය නැරඹීමට ඇරයුමක්!**
පැය 6 කට පෙර

**ඝාතන, වධහිංසා "රැල්ලක් ද?" නීතිය දැනගමු ද?**
2020 දෙසැම්බර් 8

## දැක්ම

**"හඳුනා නොගත්" කෝවිඩ් ආසාදිතයන්ගේ මළ සිරුරු ගැන තීරණයක්**

2020 දෙසැම්බර් 2

**ශ්‍රී ලංකාවට ළඟාවන "බුරවී" සුළි කුණාටුව: බේරීමට කුමක් කළ යුතුද?**

2020 දෙසැම්බර් 2

**දශකයක් තුළ ඉහළ, පහළ යන ශ්‍රී ලංකාවේ "සෞභාග්‍යතා දර්ශකය"**

2020 නොවැම්බර් 23

**මහර බන්ධනාගාරයේ ගැටුම තවමත් නිම වී නෑ - සිරකරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කමිටුව**

2020 නොවැම්බර් 30

**බන්ධනාගාර රැඳවියන් පිරිසක් වහල මත විරෝධතාවක**

2020 නොවැම්බර් 27

**එංගලන්තයේ නිරෝධායනය නොවන ලැයිස්තුවට ශ්‍රී ලංකාවත්**

2020 නොවැම්බර් 20

**කොරෝනා අවදානම හමුවේ රට සම්පූර්ණයෙන් විවෘත කළ හැකිද?**

2020 නොවැම්බර් 6

### කොරෝනා වෛරස් රෝගීන් සංඛ්‍යාව 10,000 ඉක්මවයි

2020 ඔක්තෝබර් 30

### විසි වන සංශෝධනයෙන් "අධිකරණය ශක්තිමත් කළා"

2020 ඔක්තෝබර් 27

## වැඩිපුරම කියැවූ

1 'ඇය මෙලොව දුටුවේ මගේ කුසින්-එහෙත් ඇය මගේ දුව නොව මිනිපිරියයි'

2 ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හරහා ගැමි කාන්තාවන් සූරා කෑමකට ලක්වන බවට චෝදනා

3 'රජ දැක්මට අවසරද?' දෙසැම්බර් අහසේ අසිරිය නැරඹීමට ඇරයුමක්!

4 නිදහසට ඇති විශාලතම තර්ජනය චීනයයි -ඇමරිකානු බුද්ධි අංශ ප්‍රධානියා

5 ඉන්දියාවේ 'අභිරහස්' රෝගයක්!



© 2020 BBC. බාහිර වෙබ් අඩවිවල අන්තර්ගතයට බීබීසී වගකියනු නොලැබේ. බාහිර යොමු කෙරෙහි අපගේ ප්‍රවේශය ගැන කියවන්න.